
පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව 2021

## 08 සමාජ විද්‍යාව




පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021

# ඇගයීම් වාර්තාව

## **08** - සමාජ විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින්වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ. පො. ස (උ. පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙන අධ්‍යාපන ලැබීමට හැකි මගක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා පහක් යටතේ ගොනු කර ඇත.

පිරිවෙන් සාමාන්‍ය පෙළ සමාජ විද්‍යාව විෂයයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මක ව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබාදීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයට ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ , නිගමන හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන් ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්නපත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කර ගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය ( Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය(Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024. 07.31

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීමටත් යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවී යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින්

ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

**2018** වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981 දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂය ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසාන විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග)) |
| විෂය සම්බන්ධීකරණය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග)) |
| සංස්කරණය | : | ජී. විකුම් සම්පත්<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය ලස්සනගම චන්දෝදය හිමි<br>ගුරු සේවය I<br>ශ්‍රී පුරාණ බෝධිමළු විහාරය<br>තේක්කවත්ත, කටුගස්තොට |
| | | පූජ්‍ය අමුණුපුරේ පේමානන්ද හිමි<br>ගුරු සේවය I (විශ්‍රාමික)<br>ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙන<br>රත්තේපිටිය, මැණික්දිවෙල |
| | | පූජ්‍ය වටගෙදර විමලසාර හිමි<br>ගුරු සේවය I (විශ්‍රාමික)<br>පඤ්ඤාඤාතිලකාරාමය<br>මහරගම |
| පරිගණක පිටපත සැකසුම | : | ජේ. කේ. එච්. නවෝදනී ජයනෙත්ති<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| **හැඳින්වීම** | **i** |
| **පෙරවදන** | **ii** |
| **පටුන** | **iv** |
| **වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය** | **v** |
| **1. සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු** | |
| 1.1 සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු | 1 |
| 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු | 2 |
| **I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | |
| **2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** | |
| 2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 6 |
| 2.2. I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) | 7 |
| 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය | 14 |
| 2.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා | 20 |
| **II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | |
| **3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** | |
| 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 22 |
| 3.2 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය | 23 |
| 3.3 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය | 23 |
| 3.4 II ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය | 24 |
| 3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය | 25 |
| 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන | 42 |
| **4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු** | 43 |
| **5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** | 44 |

## වගු නාමාවලිය

**පිටු අංකය**


| | |
|---|---|
| වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 2 |
| වගුව 1.2. අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය | 2 |
| වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව | 3 |
| වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව | 4 |
| වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 13 |
| වගුව 2.2 I පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 15 |
| වගුව 2.3 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය | 16 |
| වගුව 2.4 තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය, එහි පහසුතාව හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව | 18 |


## ප්‍රස්තාර නාමාවලිය

**පිටු අංකය**


| | |
|---|---|
| ප්‍රස්තාරය 2.1 I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 14 |
| ප්‍රස්තාරය 2.2 I පත්‍රයේ තේමාව අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය | 17 |
| ප්‍රස්තාරය 2.3 I පත්‍රය - තේමා අනුව පහසුතාව හා ඉදිරිපත් වී ඇති ප්‍රශ්න ප්‍රතිශතය | 19 |
| ප්‍රස්තාරය 3.1 II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 23 |
| ප්‍රස්තාරය 3.2 II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 23 |
| ප්‍රස්තාරය 3.3 II පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 24 |
| ප්‍රස්තාරය 3.4 (a) 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 27 |
| ප්‍රස්තාරය 3.4 (b) 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 27 |
| ප්‍රස්තාරය 3.5 (a) 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 29 |
| ප්‍රස්තාරය 3.5 (b) 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 29 |
| ප්‍රස්තාරය 3.6 (a) 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 31 |
| ප්‍රස්තාරය 3.6 (b) 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 31 |
| ප්‍රස්තාරය 3.7 (a) 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 33 |
| ප්‍රස්තාරය 3.7 (b) 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 33 |
| ප්‍රස්තාරය 3.8 (a) 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 35 |
| ප්‍රස්තාරය 3.8 (b) 5 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 35 |
| ප්‍රස්තාරය 3.9 (a) 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 37 |
| ප්‍රස්තාරය 3.9 (b) 6 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 37 |
| ප්‍රස්තාරය 3.10 (a) 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 39 |
| ප්‍රස්තාරය 3.10 (b) 7 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 39 |
| ප්‍රස්තාරය 3.11 (a) 8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 41 |
| ප්‍රස්තාරය 3.11(b) 8 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 41 |
| ප්‍රස්තාරය 3.12 එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 42 |

# 1 සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු

1. යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට අවස්ථාව උදා කර ගැනීම.
2. පවුලේ/ පන්සලේ / පිරිවෙනේ සාමාජිකයෙකු වශයෙන් ඔබෙන් සමාජයටත් සමාජයෙන් ඔබටත් ඉටුවිය යුතු යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැන ගැනීම.
3. නිවැරදි ජීවන අරමුණු තුළින් ජීවිතය ජය ගැනීම.
4. සමාජ වෙනස් වීම් හඳුනාගෙන ඒ සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීමට පෙළඹීම.
5. තම අනන්‍යතාවය රැක ගනිමින් සමාජයට පිවිසීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීම.
6. ශ්‍රී ලාංකික සංස්කෘතියේ පවතින සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන ක්‍රියා කිරීමට හැකියාව ලැබීම.
7. බුදු දහම ඇසුරෙන් ශ්‍රී ලාංකික සමාජය තුළ සිදු වූ පරිවර්තන අධ්‍යයනය කිරීමට හැකියාව ලැබීම.
8. සමාජ පාලනයට හේතුවන සාධක හඳුනාගෙන ඒ ඒ සාධකවල වටිනාකම ඇගයීම.
9. සමාජ ප්‍රශ්න/ගැටලු හඳුනාගෙන ඊට සාධාරණ විසඳුම් සෙවීමේ අවස්ථාව උදාකර ගැනීම.
10. සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් පවතින බව දැන ගැනීම.

## 1.2 සමාජ විද්‍යාව විෂයය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 1969 | 9 | 1978 |
| ඉංග්‍රීසි | 16 | 0 | 16 |
| එකතුව | **1985** | **9** | **1994** |

### වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 142 | 7.15 | 2 | 22.22 | 144 | 7.22 |
| B | 272 | 13.71 | 2 | 22.22 | 274 | 13.74 |
| C | 772 | 38.89 | 2 | 22.22 | 774 | 38.81 |
| S | 531 | 26.75 | 1 | 11.12 | 532 | 26.70 |
| W | 268 | 13.50 | 2 | 22.22 | 270 | 13.53 |
| එකතුව | **1985** | **100.00** | **9** | **100.00** | **1994** | **100.00** |

## වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 143 | 19 | 13.29 | 22 | 15.38 | 58 | 40.56 | 25 | 17.48 | 124 | 86.71 | 19 | 13.29 |
| ගම්පහ | 167 | 9 | 5.39 | 21 | 12.57 | 60 | 35.93 | 50 | 29.94 | 140 | 83.83 | 27 | 16.17 |
| කළුතර | 149 | 24 | 16.11 | 24 | 16.11 | 54 | 36.24 | 34 | 22.82 | 136 | 91.28 | 13 | 8.72 |
| මහනුවර | 217 | 16 | 7.37 | 36 | 16.59 | 93 | 42.86 | 61 | 28.11 | 206 | 94.93 | 11 | 5.07 |
| මාතලේ | 76 | 2 | 2.63 | 9 | 11.84 | 35 | 46.05 | 21 | 27.63 | 67 | 88.16 | 9 | 11.84 |
| නුවරඑළිය | 25 | 0 | 0.00 | 6 | 24.00 | 11 | 44.00 | 3 | 12.00 | 20 | 80.00 | 5 | 20.00 |
| ගාල්ල | 138 | 18 | 13.04 | 26 | 18.84 | 45 | 32.61 | 33 | 23.91 | 122 | 88.41 | 16 | 11.59 |
| මාතර | 153 | 12 | 7.84 | 18 | 11.76 | 51 | 33.33 | 47 | 30.72 | 128 | 83.66 | 25 | 16.34 |
| හම්බන්තොට | 118 | 3 | 2.54 | 24 | 20.34 | 55 | 46.61 | 24 | 20.34 | 106 | 89.83 | 12 | 10.17 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 35 | 2 | 5.71 | 2 | 5.71 | 23 | 65.71 | 6 | 17.14 | 33 | 94.29 | 2 | 5.71 |
| ත්‍රිකුණාමලය | 10 | 0 | 0.00 | 1 | 10.00 | 6 | 60.00 | 3 | 30.00 | 10 | 100.00 | 0 | 0.00 |
| කුරුණෑගල | 184 | 12 | 6.52 | 26 | 14.13 | 65 | 35.33 | 47 | 25.54 | 150 | 81.52 | 34 | 18.48 |
| පුත්තලම | 37 | 0 | 0.00 | 1 | 2.70 | 17 | 45.95 | 12 | 32.43 | 30 | 81.08 | 7 | 18.92 |
| අනුරාධපුර | 132 | 8 | 6.06 | 11 | 8.33 | 47 | 35.61 | 39 | 29.55 | 105 | 79.55 | 27 | 20.45 |
| පොළොන්නරුව | 34 | 1 | 2.94 | 2 | 5.88 | 8 | 23.53 | 13 | 38.24 | 24 | 70.59 | 10 | 29.41 |
| බදුල්ල | 99 | 1 | 1.01 | 7 | 7.07 | 33 | 33.33 | 43 | 43.43 | 84 | 84.85 | 15 | 15.15 |
| මොණරාගල | 69 | 7 | 10.14 | 12 | 17.39 | 25 | 36.23 | 21 | 30.43 | 65 | 94.20 | 4 | 5.80 |
| රත්නපුර | 115 | 8 | 6.96 | 13 | 11.30 | 47 | 40.87 | 29 | 25.22 | 97 | 84.35 | 18 | 15.65 |
| කෑගල්ල | 92 | 2 | 2.17 | 13 | 14.13 | 40 | 43.48 | 21 | 22.83 | 76 | 82.61 | 16 | 17.39 |
| සමස්ත ප්‍රතිඵලය | **1,994** | **144** | **7.22** | **274** | **13.74** | **774** | **38.82** | **532** | **26.68** | **1,724** | **86.46** | **270** | **13.54** |

**වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 -100 | 1 | 0.05 | 1994 | 100.00 |
| 81 - 90 | 37 | 1.86 | 1993 | 99.95 |
| 71 - 80 | 125 | 6.27 | 1956 | 98.09 |
| 61 - 70 | 301 | 15.10 | 1831 | 91.83 |
| 51- 60 | 452 | 22.67 | 1530 | 76.73 |
| 41 - 50 | 458 | 22.97 | 1078 | 54.06 |
| 31 - 40 | 368 | 18.46 | 620 | 31.09 |
| 21 - 30 | 185 | 9.28 | 252 | 12.64 |
| 11 - 20 | 60 | 3.01 | 67 | 3.36 |
| 01 - 10 | 7 | 0.35 | 7 | 0.35 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

ඉහත වගුව අධ්‍යයනයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදාහරණය -: 31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලන විට, සමාජ විද්‍යාව විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 1994 දෙනා අතුරෙන් 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 368කි. එය ප්‍රතිශතයක් වශයෙන් 18.46කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 620ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 31.09කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

| |
|---|
| **කාලය : පැය 01 යි.**<br><br>**වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.** |

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

- ❋ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
- ❋ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❋ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- ❋ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. 'සමාජ ශාස්ත්‍රවල රැජින සමාජ විද්‍යාව' ලෙස නම් කරනු ලැබූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා කවුද?
   (1) ඔගස්ට් කොම්ට් (2) මැක්ස් වේබර්
   (3) එමිල් ඩූර්කයිම් (4) කාල් මාක්ස්

2. මැක්ස් වේබර් පෙන්වා දුන් පරිදි බටහිර සමාජයේ ධනවාදී ආකල්ප ගොඩනැගීමට බලපෑ ප්‍රධාන සාධකය වන්නේ,
   (1) කාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයයි. (2) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්මයි.
   (3) විද්‍යාවේ වර්ධනයයි. (4) නාගරීකරණයයි.

3. සමාජ සිදුවීමක අන්තර් සම්බන්ධතාව නිවැරදිව අවබෝධ කර ගැනීමට වඩාත් සුදුසු බුදු දහමේ දැක්වෙන කේන්ද්‍රීය සංකල්පය මින් කුමක් ද?
   (1) පුනර්භව සංකල්පය (2) අනිත්‍ය සංකල්පය
   (3) ත්‍රිලක්ෂණ සංකල්පය (4) හේතුඵල සංකල්පය

4. සාධිත තත්ත්වයට අදාළ නිදසුන් පමණක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
   (1) ගුරුවරයා, කම්කරුවා, පුරුෂයා
   (2) ක්‍රීඩකයා, සිංහලයා, නිළිය
   (3) ගායිකාව, රියදුරු, සූපවේදියා
   (4) නිවේදකයා, හෙදිය, කිතුනුවා

5. සමාජ සමූහවල දක්නට ලැබෙන පොදු සමාජ ලක්ෂණයක් නොවන්නේ,
   (1) නිරතුරුව අන්තර් සම්බන්ධතා පැවතීම ය.
   (2) පොදු අරමුණු පැවතීම ය.
   (3) හුදකලාවූ ක්‍රියාවන් පැවතීම ය.
   (4) සංස්කෘතික අනන්‍යතාවක් පැවතීම ය.

- අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සමාජ පරිණාමීය අවධි උපයෝගී කරගන්න.
  - *A* – දේවවාදී අවධිය
  - *B* – කාර්මික අවධිය
  - *C* – රණකාමී අවධිය
  - *D* – පාරභෞතික අවධිය
  - *E* – යථානුභූත අවධිය

6. ඔගස්ට් කොම්ට් ඉදිරිපත් කළ සමාජ පරිණාමයේ අවධි තුන අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) *A, B, C* (2) *A, C, D* (3) *A, D, E* (4) *B, D, E*

7. හර්බට් ස්පෙන්සර් දැක්වූ සමාජ පරිණාමයේ අවධි දෙක සඳහන් වරණය කුමක් ද?
   (1) *A, B* (2) *B, C* (3) *C, D* (4) *D, E*

- අංක 8 සහ 9 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ලක්ෂණ උපයෝගී කරගන්න.
  - *A* – මුඩුක්කු නිවාස බිහිවීම
  - *B* – මහා පරිමාණ කර්මාන්තශාලා බිහිවීම
  - *C* – තරගකාරී අර්ථ ක්‍රමයක් බිහිවීම
  - *D* – වීදි දරුවන් බහුල වීම
  - *E* – නවීන විද්‍යාත්මක දැනුමට මූලිකත්වයක් ලැබීම

8. ඉහත ලක්ෂණ අතුරින් නාගරීකරණයේ යහපත් ප්‍රතිඵල පමණක් දැක්වෙන නිවැරදි වරණය කුමක් ද?
   (1) *A, B, C* (2) *A, C, E* (3) *B, C, D* (4) *B, C, E*

9. ඉහත ලක්ෂණ අතුරින් නාගරීකරණයේ අයහපත් ලක්ෂණ පමණක් සඳහන් වරණය කුමක් ද?
   (1) *A, D* (2) *B, C* (3) *C, D* (4) *D, E*

- අංක 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ලක්ෂණ උපයෝගී කරගන්න.
  - *A* – (i) මුඩුක්කු නිවාස බිහිවීම
    (ii) අතිරික්ත නිෂ්පාදනය
  - *B* – (i) රාජ්‍ය පාලකයාගේ බලය
    (ii) ජනතා පරමාධිපත්‍ය
  - *C* – (i) මුදලට ඇති සමාජ පිළිගැනීම
    (ii) ආරෝපිත තත්ත්වයන්ගේ සමාජ බලපෑම
  - *D* – (i) ශ්‍රම විභජනය
    (ii) අන්තර පරායත්තතාවය/අන්තර් යැපීම

10. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි වැඩිවීම කෙරෙහි බලපාන යුගල දෙක වන්නේ,
    (1) *A* සහ *B* ය. (2) *A* සහ *D* ය. (3) *B* සහ *C* ය. (4) *B* සහ *D* ය.

11. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි අඩුවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
    (1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *B* සහ *C* ය. (4) *B* සහ *D* ය.

12. වසල සූත්‍රයේ දැක්වෙන ඉගැන්වීම්වලට අනුව පුද්ගලයාගේ සමාජ තත්ත්වය තීරණය කළ යුතු වන්නේ,
    (1) කරනු ලබන ක්‍රියාව අනුව ය. (2) උපත ලැබූ පවුල් පසුබිම අනුව ය.
    (3) කුල සම්ප්‍රදාය අනුව ය. (4) වත්කම් ප්‍රමාණය අනුව ය.

13. කූටදන්ත සූත්‍රයට අනුව මිනිසා විසින් සිදු කළ යුතු උතුම් ම යාගය වන්නේ,
    (1) අශ්වමේධ යාගයයි. (2) ශීල ප්‍රතිපත්තියේ හික්මීමයි.
    (3) පිතෘලෝක යාගයයි. (4) සදිසා නමස්කාරයේ යෙදීමයි.

14. පහත දැක්වෙන ධර්ම කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.

A – උත්සාහ සම්පත්තිය
B – ප්‍රඥා සම්පත්තිය
C – ආරක්ෂා සම්පත්තිය
D – යහපත් මිතුරන් ඇසුර
E – ආදායමට සමාන ජීවිකාව

ඉහත කරුණු අතුරින් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව මෙලොව දියුණුව සඳහා පිළිපැදිය යුතු ධර්ම කරුණු පමණක් සඳහන් වරණය කුමක් ද?

(1) A, B, C, D (2) A, B, C, E (3) A, C, D, E (4) B, C, D, E

15. සංස්කෘතිය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංස්කෘතිය දැනුම් භාණ්ඩාගාරයකි.
(2) සංස්කෘතිය සමාජ පාලන උපකරණයකි.
(3) ස්වාභාවික පරිසරයේ ඇති සියල්ල සංස්කෘතියට අයත් වේ.
(4) සංස්කෘතිය සමාජයෙන් සමාජයට වෙනස් වේ.

16. කිසියම් සංස්කෘතියක පවතින අංග තවත් සංස්කෘතියකට නිරායාසයෙන් ව්‍යාප්තවීම හඳුන්වන්නේ,
(1) සංස්කෘතික ලැග්ම ලෙසයි. (2) සංස්කෘතික සරිය ලෙසයි.
(3) සංස්කෘතික ගැටුම ලෙසයි. (4) සංස්කෘතික විසරණය ලෙසයි.

17. තමන්ට හුරු පුරුදු සංස්කෘතිය උසස් ලෙසත්, නුපුරුදු අන්‍ය සංස්කෘතීන් පහත් ලෙසත් සැලකීම,
(1) සංස්කෘතික ශීඝ්‍රතාවයි. (2) සංස්කෘතික සාපේක්ෂතාවයි.
(3) සංස්කෘතික අනුකූලතාවයි. (4) මානව කේන්ද්‍රණවාදයයි.

18. බෞද්ධ විහාරස්ථාන මගින් සංවිධානය කෙරෙන පෙරහැර සංස්කෘතියේ සමාජ විද්‍යාත්මක වටිනාකම වඩාත් හොඳින් පැහැදිලි වන්නේ මින් කුමන වරණයෙන් ද?
(1) මානව අන්තර් සම්බන්ධතා පැවැත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය වීම
(2) විහාරස්ථානයේ කීර්තිය ප්‍රදර්ශනය කිරීමට අවකාශය සැලසීම
(3) ජනයාට සතුට සහ විනෝදය සඳහා අවස්ථාවක් ලැබීම
(4) නර්තන ශිල්පීන්ගේ හැකියා පෙන්වීමට අවස්ථාවක් ලැබීම

19. "මිනිසුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහා ඉතා හොඳ මාර්ගය නම් අධ්‍යාපනයයි" යන ප්‍රකාශය සිදු කර ඒ අනුව ක්‍රියා කරමින් ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රීසි පාලකයා කවුද?
(1) ටොරින්ටන් ආණ්ඩුකාරවරයා
(2) තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා
(3) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා
(4) ස්ටුවර්ට් මැකන්සි ආණ්ඩුකාරවරයා

20. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආගම් කිහිපයක් 'X' තීරුවේ ද ආගමික ග්‍රන්ථ කිහිපයක් 'Y' තීරුවේ ද දැක්වේ.

| 'X' | 'Y' |
|---|---|
| i. බෞද්ධ ආගම | A – කුරානය |
| ii. හින්දු ආගම | B – ධම්මපදය |
| iii. ක්‍රිස්තියානි ආගම | C – භගවත් ගීතාව |
| iv. ඉස්ලාම් ආගම | D – බයිබලය |

ඉහත 'Y' තීරුවේ සඳහන් ආගමික ග්‍රන්ථ 'X' තීරුවේ දී ඇති ආගම්වල අනුපිළිවෙළට නිවැරදිව ගැළපූවිට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A, B, C, D (2) B, C, D, A (3) C, D, A, B (4) D, C, B, A

21. ශ්‍රී ලංකාවේ අතීත ජන සමාජය පිළිබඳ තොරතුරු ගවේෂණය කළ හැකි දේශීය සාහිත්‍ය මූලාශ්‍රයය පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) පූජාවලිය, වංසත්ථප්පකාසිනී, රාජරත්නාකරය
   (2) මහාවංශය, ලංකාවතාර සූත්‍රය, සමන්තපාසාදිකා
   (3) දීපවංශය, දාඨාවංස, රාජ තරංගනී
   (4) සිලප්පදිකාරම්, බෝධි වංසය, ධර්මප්‍රදීපිකාව

22. පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
   *A* – අර්ථාන්විත සමාජ අන්තර් සම්බන්ධතා පැවැත්වීම
   *B* – සමාජය නිරතුරුව ස්ථිතිකව පැවතීම
   *C* – සමාජයේ සාමාජිකයින් අතර අන්තර් පරායත්තතාවක් පැවතීම
   *D* – සමාජ අන්තර් ක්‍රියා පැවතීම

   ඉහත ඒවා අතුරින් සමාජයක පවතින ලක්ෂණ දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

23. මානව විද්‍යාඥයින්ගේ අධ්‍යයන තොරතුරු අනුව පැරණි ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් සහිත රාජ්‍යයකි. ඒ සඳහා බලපෑ ප්‍රධාන සාධකය වනුයේ,
   (1) වැව් අමුණු ඇතුළු දියුණු වාරිමාර්ග පද්ධතියක් පැවතීමයි.
   (2) රාජ්‍ය පාලකයින් විසින් ගොවීන්ට සහනාධාර ලබාදීමයි.
   (3) කෘෂිකර්මයට යෝග්‍ය ආකාරයට පවුල් ක්‍රමය සැකසී තිබීමයි.
   (4) විදේශීය කෘෂි තාක්ෂණ ක්‍රම අනුව වගාවන් සිදු කිරීමයි.

● අංක **24** සහ **25** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ලක්ෂණ උපයෝගී කරගන්න.
   *A* – ධනවාදී ආර්ථ ක්‍රමයට යොමුවීමේ ප්‍රවණතාව
   *B* – සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත රැකියාවලට යොමුවීමේ ප්‍රවණතාව
   *C* – අපනයන අභිමුඛ කර්මාන්තවලට යොමුවීමේ ප්‍රවණතාව
   *D* – වාණිජ භෝග වගාවක් සඳහා යොමුවීමේ ප්‍රවණතාව
   *E* – පාසල ප්‍රමුඛ කරගත් අධ්‍යාපනයට යොමුවීමේ ප්‍රවණතාව
   *F* – විදේශ රැකියා සඳහා යොමුවීමේ ප්‍රවණතාව

24. බටහිර අධිරාජ්‍යවාදීන්ගේ බලපෑම නිසා ප්‍රථමයෙන් ම ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ ප්‍රවණතා පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) *A, B* සහ *C* (2) *A, D* සහ *E* (3) *B, D* සහ *E* (4) *B, E* සහ *F*

25. වර්ෂ 1977 හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ බලපෑමෙන් ශ්‍රී ලාංකේය ආර්ථිකය තුළ ඇති වූ නව ප්‍රවණතා පමණක් දැක්වෙන වරණය තෝරන්න.
   (1) *A, B* සහ *E* (2) *A, C* සහ *E* (3) *B, C* සහ *F* (4) *B, D* සහ *E*

26. සමාජයකට සමාජ පාලනයක් අත්‍යවශ්‍ය වන්නේ පහත සඳහන් කවර චිත්ත වේගයන් පමණක් සහිත පුද්ගලයන්ගේ ගහණය වැඩිවන විට ද?
   (1) ආදරය, මෛත්‍රිය, පළිගැනීම, අනුකම්පාව
   (2) පරාර්ථකාමිත්වය, වෛරය, දයාව, කරුණාව
   (3) ආත්මාර්ථකාමිත්වය, ආදරය, අනුකම්පාව, දයාව
   (4) ද්වේෂය, ඊර්ෂ්‍යාව, වෛරය, ආත්මාර්ථකාමිත්වය

27. ශ්‍රී ලංකාවේ ගැමි සමාජ පාලනය සඳහා ඉංග්‍රීසි ආණ්ඩුව විසින් හඳුන්වා දුන් "ගම් ප්‍රධානියා" (Village Headmen) යන තනතුර වර්තමානයේ දී හැඳින්වෙන්නේ,
   (1) ගමික ලෙසයි. (2) ග්‍රාම නිලධාරියා ලෙසයි.
   (3) ගම් මුලාදෑනි ලෙසයි. (4) ගමේ ආරච්චිරාළ ලෙසයි.

28. රක්ෂිත බන්ධනාගාරයක මූලිකම කාර්ය වන්නේ,
   (1) සැකකරුවන් උසාවියට ඉදිරිපත් කිරීමයි.
   (2) වරදකරුවන් පුනරුත්ථාපනය කිරීමයි.
   (3) වරදකරුවන් දණ්ඩනයට ලක් කිරීමයි.
   (4) සැකකරුවන් හෝ වරදකරුවන් විධිමත් අධ්‍යාපනයට යොමු කිරීමයි.

29. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ එකම සහ පූර්ණ බලය ඇති උත්තරීතර අධිකරණ ආයතනය කුමක් ද?
   (1) මහාධිකරණය (2) අභියාචනා අධිකරණය
   (3) දිසා අධිකරණය (4) ශ්‍රේෂ්ඨාධිකරණය

30. සිත, කය සහ වචනය සංවර කරගෙන ස්වයං පාලන කුසලතා වර්ධනය කර ගැනීම සඳහා බුදු දහමේ ඉගැන්වෙන වඩාත් උචිත ක්‍රියාකාරකම මින් කුමක් ද?
   (1) බෝධිපූජා සිදු කිරීම (2) දන් දීම
   (3) භාවනා කිරීම (4) ධර්ම දේශනා ශ්‍රවණය කිරීම

31. එමිල් ඩුර්කයිම්ට අනුව සමාජ ගැටලු ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රමුඛ සාධකය වන්නේ,
   (1) සමාජ අනෝමීය තත්ත්වයයි. (2) දේශපාලන ත්‍රස්තවාදයයි.
   (3) මානසික අසහනයයි. (4) පරාරෝපණයයි.

32. පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
   *A* – නීතියෙන් තහනම් කළ සහ දඬුවමට යටත් කළ ක්‍රියා
   *B* – සමාජයක සම්මත සදාචාරයට පටහැනිව කරනු ලබන ක්‍රියා
   *C* – මානුෂික හැඟීම්වලට විරුද්ධ ව කරන ක්‍රියා
   *D* – අපරාධ නීතිය උල්ලංඝනය කරන ක්‍රියා

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් අපරාධ සම්බන්ධ ව වඩාත් නිවැරදි අර්ථකථනය පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

33. පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
   *A* – ආරක්ෂක අංශවල රැකියා අවස්ථා වැඩි වේ.
   *B* – සමාජ දේහය විසංවිධානය වේ.
   *C* – සමාජ අනාරක්ෂිතතාව වර්ධනය වේ.
   *D* – අතුරුඵල ලෙස සමාජ ගැටලු වර්ධනය වේ.

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ජනවාර්ගික අර්බුදයක අයහපත් ලක්ෂණ පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

34. පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
   *A* – ඒඩ්ස් රෝග කාරකය වන්නේ මානව ප්‍රතිශක්ති ඌනතා වයිරසයයි.
   *B* – ඒඩ්ස් රෝගය ව්‍යාප්තවීම රටක ආර්ථික පරිහානියට හේතු වේ.
   *C* – ඒඩ්ස් රෝගයට වැඩි වශයෙන් ගොදුරු වන්නේ තරුණ තරුණියන් ය.
   *D* – ඒඩ්ස් රෝගීන්ට වෙනත් රෝග කාරක වයිරස ආසාදනය නොවේ.

   ඉහත ඒවායින් ඒඩ්ස් රෝගය නම් සමාජ ගැටලුව සම්බන්ධව නිවැරදි ප්‍රකාශ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

35. තමා අයත් සමූහයේ අපේක්ෂා සාධනය වෙනුවෙන් ජීවිතය කැප කිරීම හැඳින්වෙනුයේ,
   (1) ආත්මීය සිය දිවි නසා ගැනීම ලෙසයි. (2) අනෝමීය සිය දිවි නසා ගැනීම ලෙසයි.
   (3) පරහිතකාමී සිය දිවි නසා ගැනීම ලෙසයි. (4) දෛවෝපගත සිය දිවි නසා ගැනීම ලෙසයි.

36. කාලාම සූත්‍රයේ ඉගැන්වීම් අනුව යමක් පිළිබඳ අවසන් තීරණයක් ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණක් දැක්වෙන වරණය කුමක් ද?

(1) තම මතවාදයට ගැළපෙන දෙයක් වීම (2) තම පරම්පරාවේ පිළිගැනීමට ලක් වූ දෙයක් වීම

(3) පොත්පත්වල සඳහන් දෙයක් වීම (4) බුද්ධිමතුන්ගේ පිළිගැනීමට ලක් වූ දෙයක් වීම

37. සමීක්ෂණයක් සඳහා ප්‍රශ්නාවලිය භාවිත කළ ශීලානන්ද හිමියන්ට එමගින් ගැටලුවට අදාළ සියලු තොරතුරු අනාවරණය කරගත හැකි විය. මෙම ගුණාංගය දත්ත රැස්කිරීමේ උපකරණයේ,

(1) විශ්වසනීයතාව ලෙස හැඳින්වේ. (2) වලංගුතාව ලෙස හැඳින්වේ.

(3) වාස්තවික බව ලෙස හැඳින්වේ. (4) ප්‍රායෝගික බව ලෙස හැඳින්වේ.

● පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුර යුගයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ පර්යේෂණයක් කරන්නට අදහස් කළ නාරද හිමියන් අනුරාධපුර යුගයේ සමාජය සහ අධ්‍යාපනය සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණ වාර්තා, රචනා වී ඇති පොත්පත්, ලිපිලේඛන අධ්‍යයනය කර පර්යේෂණ යෝජනාවක් සකස්කර ඒ සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. පසුව අනුරාධපුර යුගය පිළිබඳ තොරතුරු දැක්වෙන සෙල්ලිපි, තඹ පත්, පුස්කොළ පොත් මෙන් ම දේශීය හා විදේශීය පොත්පත් කියවා දත්ත රැස්කරගත් අතර ශේෂ වී ගිය ආරාමික සහ ආරාමික නොවන ගොඩනැගිලි නිරීක්ෂණය කර තොරතුරු සටහන් කර ගන්නා ලදී. අනතුරුව එකතු කළ දත්ත විශ්ලේෂණය කර නිගමන සහ යෝජනා ඇතුළත් කර පර්යේෂණ වාර්තාව සකසන ලදී.

38. නාරද හිමියන් තෝරාගත් පර්යේෂණය අයත් වන්නේ කුමන පර්යේෂණ වර්ගයට ද?

(1) ඓතිහාසික පර්යේෂණ (2) විස්තරාත්මක පර්යේෂණ

(3) මූලික පදනම් පර්යේෂණ (4) අත්හදා බැලීමේ පර්යේෂණ

39. නාරද හිමියන් පර්යේෂණ සඳහා තොරතුරු එකතු කළ සෙල්ලිපි, තඹපත්, පුස්කොළ පොත් දේශීය සහ විදේශීය පොත්පත් යන තොරතුරු මූලාශ්‍රය කාණ්ඩය ප්‍රධාන වශයෙන් හැඳින්වෙන්නේ,

(1) අලිඛිත මූලාශ්‍රය ලෙසයි. (2) පුරාවිද්‍යා මූලාශ්‍රය ලෙසයි.

(3) ලිඛිත මූලාශ්‍රය ලෙසයි. (4) නාණක මූලාශ්‍රය ලෙසයි.

40. නාරද හිමියන් සිය අධ්‍යයනය සඳහා උපයෝගී කරගත් පහත මූලාශ්‍රය අතුරින් ද්විතියික මූලාශ්‍රයක් වන්නේ මින් කුමක් ද?

(1) සෙල්ලිපි (2) ශේෂ වී ගිය ආරාමික ගොඩනැගිලි


(3) පුස්කොළ පොත් (4) පර්යේෂණ වාර්තා

**වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 21. | 1 |
| 02. | 2 | 22. | 3 |
| 03. | 4 | 23. | 1 |
| 04. | 3 | 24. | 2 |
| 05. | 3 | 25. | 3 |
| 06. | 3 | 26. | 4 |
| 07. | 2 | 27. | 2 |
| 08. | 4 | 28. | 1 |
| 09. | 1 | 29. | 4 |
| 10. | 2 | 30. | 3 |
| 11. | 3 | 31. | 1 |
| 12. | 1 | 32. | 2 |
| 13. | 2 | 33. | 4 |
| 14. | 3 | 34. | 1 |
| 15. | 3 | 35. | 3 |
| 16. | 4 | 36. | 4 |
| 17. | 4 | 37. | 2 |
| 18. | 1 | 38. | 1 |
| 19. | 1 | 39. | 3 |
| 20. | 2 | 40. | 4 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණ




ප්‍රස්තාරය 2.1(RD/16/02/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණය මගින් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 20 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.85කි. එනම් 20 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 85%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව 20 ප්‍රශ්නයේ පහසුතාව 85%ක් ලෙස දැක්විය හැකිය.

## වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 1 | 61.87 | 13.08 | 12.31 | 10.55 | 2.20 |
| 2 | 2 | 22.97 | 42.20 | 12.20 | 21.76 | 0.88 |
| 3 | 4 | 12.53 | 14.07 | 17.69 | 54.29 | 1.43 |
| 4 | 3 | 42.09 | 10.33 | 35.60 | 10.33 | 1.65 |
| 5 | 3 | 4.29 | 12.97 | 74.07 | 8.24 | 0.44 |
| 6 | 3 | 8.68 | 9.12 | 74.51 | 6.81 | 0.88 |
| 7 | 2 | 4.84 | 72.86 | 10.00 | 11.65 | 0.66 |
| 8 | 4 | 8.46 | 9.12 | 6.59 | 74.95 | 0.88 |
| 9 | 1 | 77.14 | 6.48 | 6.26 | 9.56 | 0.55 |
| 10 | 2 | 12.31 | 33.74 | 27.14 | 25.49 | 1.32 |
| 11 | 3 | 12.86 | 36.81 | 30.55 | 18.24 | 1.54 |
| 12 | 1 | 74.51 | 14.18 | 7.58 | 3.30 | 0.44 |
| 13 | 2 | 8.24 | 63.08 | 11.65 | 16.04 | 0.99 |
| 14 | 3 | 25.93 | 19.45 | 45.93 | 6.81 | 1.87 |
| 15 | 3 | 21.76 | 14.95 | 49.34 | 13.52 | 0.44 |
| 16 | 4 | 15.60 | 6.26 | 12.97 | 64.29 | 0.88 |
| 17 | 4 | 12.97 | 33.08 | 28.79 | 24.07 | 1.10 |
| 18 | 1 | 66.81 | 13.30 | 11.65 | 7.47 | 0.77 |
| 19 | 1 | 35.49 | 26.70 | 24.95 | 11.54 | 1.32 |
| 20 | 2 | 6.37 | 85.05 | 4.84 | 3.19 | 0.55 |
| 21 | 1 | 24.51 | 44.84 | 25.60 | 4.40 | 0.66 |
| 22 | 3 | 9.12 | 26.92 | 51.43 | 12.20 | 0.33 |
| 23 | 1 | 68.68 | 9.34 | 14.40 | 7.03 | 0.55 |
| 24 | 2 | 18.35 | 51.21 | 15.38 | 14.07 | 0.99 |
| 25 | 3 | 12.31 | 16.70 | 57.80 | 12.20 | 0.99 |
| 26 | 4 | 19.67 | 7.36 | 11.76 | 60.44 | 0.77 |
| 27 | 2 | 6.26 | 73.96 | 10.11 | 9.45 | 0.22 |
| 28 | 1 | 40.44 | 32.09 | 14.40 | 12.53 | 0.55 |
| 29 | 4 | 24.51 | 11.54 | 7.91 | 54.95 | 1.10 |
| 30 | 3 | 6.59 | 12.20 | 66.70 | 13.85 | 0.66 |
| 31 | 1 | 34.40 | 22.31 | 36.26 | 5.82 | 1.21 |
| 32 | 2 | 10.99 | 48.46 | 24.84 | 15.38 | 0.33 |
| 33 | 4 | 9.23 | 10.77 | 17.91 | 61.21 | 0.88 |
| 34 | 1 | 48.02 | 10.00 | 27.36 | 13.41 | 1.21 |
| 35 | 3 | 18.35 | 13.30 | 58.57 | 8.57 | 1.21 |
| 36 | 4 | 26.92 | 13.85 | 6.81 | 51.65 | 0.77 |
| 37 | 2 | 30.00 | 14.73 | 13.30 | 40.22 | 1.76 |
| 38 | 1 | 65.27 | 16.37 | 6.81 | 11.10 | 0.44 |
| 39 | 3 | 6.48 | 42.97 | 42.75 | 6.92 | 0.88 |
| 40 | 4 | 23.74 | 34.40 | 16.81 | 24.51 | 0.55 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

"Missing" තීරුවේ ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතයයි.

**වගුව 2.3 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය**


| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| සමාජ විද්‍යාවේ ආරම්භය විකාශනය හා මූලික සංකල්ප | 2,4,5,15,16,17,22,32,34 |
| සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාලෝක | 1,6,7,31,35 |
| සමාජ විද්‍යාත්මක ක්‍රමවේද | 21,37,38,39,40 |
| ව්‍යවහාරික සමාජ විද්‍යාව | 8,9,10,11,18,19,20,23,24,25,27,28, 29, 33 |
| බුදු දහම හා සමාජ විද්‍යාව | 3,12,13,14,26,30,36 |

සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය ප්‍රධාන තේමා 05කට ගොනු කර ඇත. එක් එක් තේමාවක් යටතේ ඇති ප්‍රශ්න ප්‍රමාණය විවිධාකාර වේ. ව්‍යවහාරික සමාජ විද්‍යා යන තේමාවට වැඩි බරක් දී ඇති අතර, ප්‍රශ්න 40න් 14ක්ම එම තේමාව යටතේ ඉදිරිපත් කර ඇත.

සමාජ විද්‍යා න්‍යාය හා පර්යාලෝකය හා සමාජ විද්‍යාත්මක ක්‍රමවේද යන තේමාවන්ට අඩු බරක් දී ඇති අතර ඉදිරිපත් කර ඇත්තේ ප්‍රශ්නය පහ බැගිනි.

අනික් තේමා 03 සඳහා ප්‍රශ්න සැකසීමේ දී විශේෂයක් දක්වා නොමැත.

පෙළපොතේ හා ගුරු මාර්ගෝපදේශයේ දක්වෙන පාඩම් නිපුණතා වලට අදාළ ව්‍යවහාරයන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කර තිබේ. සමාජ විද්‍යා විෂයේ මූලික සංකල්ප හා සමාජ විද්‍යාව පිළිබඳ බෞද්ධ පදනම කෙරෙහි අවධානය යොමු කර ඇත.




ප්‍රස්තාරය 2.2 (RD/16/02/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.

සමාජ විද්‍යාවේ ආරම්භය විකාශනය හා මූලික සංකල්ප තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න 09 අතුරෙන් පහසුතාව වැඩිම 5 ප්‍රශ්නයෙහි පහසුතාව 74%කි. එම තේමාව යටතේ 24%ක අඩුම පහසුතාව 17වන ප්‍රශ්නයයි. ප්‍රශ්න 09 අතුරෙන් ප්‍රශ්න 07ක්ම 40%කට වැඩි පහසුතාවකින් යුතුය. මෙම තේමාව පිළිබඳ සිසුන්ගේ  සාධන මට්ටම සතුටුදායක මට්ටමක පවතියි.

**සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාලෝක** තේමාව යටතේ ප්‍රශ්න 05ක් ඇතුළත්ව ඇති අතර පහසුතාව වැඩිම 6වන ප්‍රශ්නයෙහි පහසුතාව 75%කි. එම ප්‍රශ්න 05 අතුරෙන් පහසුතාව අඩුම 31 ප්‍රශ්නයෙහි පහසුතාව 34%කි. අනෙක් ප්‍රශ්න සියල්ලෙහිම පහසුතාව 50% ඉක්මවා ඇත.


**සමාජ විද්‍යාත්මක ක්‍රමවේද** තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න සංඛ්‍යාව 05කි. එම තේමාව යටතේ පහසුතාව වැඩිම 38 ප්‍රශ්නයෙහි පහසුතාව 65%කි. අනෙක් ප්‍රශ්න හතරම 50%ක පහසුතාවට ළඟා වී නොමැත. ඉන් පහසුතාව අඩුම 37 ප්‍රශ්නය  සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් මාතෘකාව යටතේ සකසා ඇති අතර එහි පහසුතාව 15%කි. මේ අනුව සමාජ විද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳ සිසුන්ගේ සාධනය සාපේක්ෂව අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය වේ.

**ව්‍යවහාරික සමාජ විද්‍යාව** තේමාව යටතේ ප්‍රශ්න 14ක් ඉදිරිපත් කර ඇත. ඉන් පහසුතාව වැඩිම 20 ප්‍රශ්නයෙහි පහසුතාව 85%කි. පහසුතාව  අඩුම 11 ප්‍රශ්නයෙහි  පහසුතාව 31%කි.  එමෙන්ම ප්‍රශ්න 14 අතුරෙන් ප්‍රශ්න දහයක්ම 50%ක පහසුතාව ඉක්මවා ඇති අතර 50%කට අඩු පහසුතාව සහිත ප්‍රශ්න සංඛ්‍යාව 04කි. මේ අනුව ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ ශිෂ්‍ය සාධනය යහපත් මට්ටමක පවතියි.

බුදු දහම හා සමාජ විද්‍යාව යටතේ ප්‍රශ්න 07ක් ඇතුළත්ව ඇත. ඉන් පහසුතාව වැඩිම 12 ප්‍රශ්නයෙහි පහසුතාව 75%කි.  අඩුම 14 ප්‍රශ්නයෙහි පහසුතාව  46%කි.  මෙම තේමාව යටතේ ප්‍රශ්න හයකම  පහසුතාව 50% පහසුතාව ඉක්මවා තිබීම සුවිශේෂීව නිරීක්ෂණය වේ.

**වගුව 2.4 තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය, එහි පහසුතාව හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව**

| තේමාව /විෂය ක්ෂේත්‍රය | පහසුතාව වැඩි ම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්නය හා එහි පහසුතාව | ප්‍රශ්නවල සමස්ත පහසුතාව |
|---|---|---|---|
| සමාජ විද්‍යාවේ ආරම්භය විකාශනය හා මූලික සංකල්පය | 5(74%) | 17(24%) | 49% |
| සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාලෝක | 6(74%) | 31(34%) | 60% |
| සමාජ විද්‍යාත්මක ක්‍රමවේද | 38(65.27%) | 40(24%) | 34% |
| ව්‍යවහාරික සමාජ විද්‍යාව | 20(85%) | 11(31%) | 58% |
| බුදු දහම හා සමාජ විද්‍යාව | 30(67%) | 12(15%) | 60% |




තේමා පහ යටතේ විවිධ ප්‍රමාණයන්ගෙන් ප්‍රශ්න සැකසීමේ දී තේමා අතර බර තැබීම විවිධ වේ. සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාලෝකය හා බුදු දහම හා සමාජ විද්‍යාව යන තේමාවන් යටතේ සකසා ඇති ප්‍රශ්නවල සමස්ත පහසුතාව 60%කි. නමුත් සමාජ විද්‍යාත්මක ක්‍රමවේද තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්නවල සමස්ත පහසුතාව 34%කි.

මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඒ ඒ පාඩම් මාතෘකා යටතේ ඇති සමාජ විද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. එමෙන්ම සමාජ විද්‍යාවේ ආරම්භ විකාශය හා මූලික සංකල්ප පිළිබඳව ද වැඩි අවධානයක් යොමුකර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතුව පවතී.

සමාජ විද්‍යාවේ I පත්‍රයෙහි ප්‍රශ්න 40 සැකසීමේදී වැඩි බරක් තබා ඇත්තේ ව්‍යවහාරික සමාජ විද්‍යාව කෙරෙහිය. එම තේමාව යටතේ ඉදිරිපත්ව ඇති ප්‍රශ්න ප්‍රතිශතය 35%කි. එම තේමාවෙහි පහසුතාව ද 58%ක තරම් ඉහළ මට්ටමක පවතී. සමාජ විද්‍යා විෂය නිරිදේශයේ දැක්වෙන මාතෘකා 07ම ආවරණය වන ලෙස එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර තිබේ.

සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න ප්‍රතිශතය 23%කි. එම තේමාවෙහි සමස්ත පහසුතාව 49%කි. සමාජ විද්‍යා නිර්දේශයේ විවිධ මාතෘකා තුළ අන්තර්ගත මූලික සමාජ විද්‍යා සිද්ධාන්ත ඇසුරින් ප්‍රශ්න සකසා ඇත. මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හා ඒවායේ ව්‍යවහාරය පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

සමාජ විද්‍යාවේ I පත්‍රයේ ප්‍රශ්න 40 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය ව්‍යවහාරික සමාජ විද්‍යාව යටතේ සකසා ඇති 20 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 85%කි. එමෙන්ම පහසුතාව අඩුම 37ප්‍රශ්නයේ සමාජ විද්‍යාත්මක ක්‍රමවේද යන තේමාව ඇසුරින් සකසා ඇති අතර එහි පහසුතාව 15%කි.

## 2.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න 40කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. මෙයින් සමාජ විද්‍යාව පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, ඇගයීම හා නිර්මාණය යන බුද්ධිමය කුසලතා මැන බැලීම සිදු කෙරේ.

මෙම බහුවරණ ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතු වන්නේ ඒ සඳහා සැකසූ විශේෂ ආකෘතියකය. I පත්‍රයට පිළිතුරු සැපයීමට දී ඇති කාලය පැයකි.

I පත්‍රයේ ප්‍රශ්න 40 සැකසීමේ දී **සමාජ විද්‍යාව ආරම්භය, විකාශනය හා මූලික සංකල්ප** තේමාවට ප්‍රශ්න 09ක්ද, **සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාවලෝක** යන තේමාවට ප්‍රශ්න 05ක්ද, **සමාජ විද්‍යාත්මක ක්‍රමවේද** යන තේමාවට ප්‍රශ්න 05ක්ද, **ව්‍යවහාරික සමාජ විද්‍යාව** යන තේමාවට ප්‍රශ්න 14ක්ද, **බුදු දහම හා සමාජ විද්‍යාව** යන තේමාවට ප්‍රශ්න 07ක්ද, ඇතුළත් වී ඇත.

සමාජ විද්‍යාව ආරම්භය, විකාශනය හා මූලික සංකල්ප තේමාවෙහි පහසුතාව 49%කි. එම තේමාව පිළිබඳව මධ්‍යස්ථ අවබෝධයක් අපේක්ෂකයන් සතුව ඇති බව මෙයින් අනාවරණය වේ. සමාජ විද්‍යාව ආරම්භය, විකාශනය හා මූලික සංකල්ප පිළිබඳ ගැඹුරු පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට මේ සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බව යෝජනා කෙරෙයි.

සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාවලෝක යන තේමාවෙහි පහසුතාව 69%කි. මෙම තේමාව සඳහා ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. මෙවැනි ඉහළ පහසුතාවක් සහිත තේමාවන්ට අදාළ පසුගිය විභාග ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීම සම්බන්ධයෙන් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී ගැඹුරින් සාකච්ඡා මෙහෙයවීම අත්‍යවශ්‍ය වේ. එමගින් සමස්ත ප්‍රශ්න පත්‍රය සඳහාම ශිෂ්‍ය සාධනය තව දුරටත් සංවර්ධනය කර ගැනීමට මඟ පෑදේ.

සමාජ විද්‍යාත්මක ක්‍රමවේද යන තේමාවේ පහසුතාව 34%කි. මෙම තේමාව පිළිබඳව ප්‍රාමාණික දැනුමක් හා අවබෝධයක් ලබා දීමට පරිවේණාචාර්යවරුන් කටයුතු කළ යුතු ය. ඒ සඳහා ගුරුමාර්ගෝපදේශයේ දැක්වෙන ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කිරීමට යෝජනා කෙරේ.

ව්‍යවහාරික සමාජ විද්‍යාව යන තේමාවේ පහසුතාව 58%කි. වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් සකසා ඇත්තේ ද මෙම තේමාව යටතේය. මෙම තේමාවට ඉදිරිපත් විය හැකි ආකාරයේ ප්‍රශ්න සඳහා ශිෂ්‍යයින් පෙර පුහුණු වීම් සිදු කළ යුතු ය. පෙළපොතේ දැක්වෙන කරුණු පමණක් නොව කාලීන සමාජ සිදුවීම් පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීමට පරිවේණාචාර්යවරුන් කටයුතු කළ යුතු ය.

බුදු දහම හා සමාජ විද්‍යාව යන තේමාවේ පහසුතාව 60%කි. මෙම තේමාවට ප්‍රශ්න 07ක් ඇතුළත් කර ඇත. බුදු දහම හා සමාජ විද්‍යාව තුලනාත්මකව හඳුනා ගැනීමටත් ඒ පිළිබඳව ප්‍රායෝගික දැනුම ලබාදීමටත් තවදුරටත් පරිවේණාචාර්යවරු උනන්දු විය යුතු ය.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II** පත්‍රය - කාලය **:** පැය 02යි**.**

**I** පත්‍රය - පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න **10**කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලකුණු **20**කි.


සෙසු ව්‍යුහගත ප්‍රශ්න හතෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය . එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

**II** පත්‍රය සඳහා මුළු ලකුණු **= 20 + 40 = 60**

අවසාන ලකුණ ගණනය කිරීම **:**

| | | |
|---|---|---|
| **I** පත්‍රය | = | **40** |
| **II** පත්‍රය | = | **60** |
| අවසාන ලකුණ | = | **100** |

## 3.2 II වන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය





ප්‍රස්තාරය 3.1 ( RD/16/2/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදී)

මෙම ප්‍රස්තාරයෙන් II පත්‍රයේ ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය නිරූපණය වේ. මෙහි I ප්‍රශ්නය අනිවාර්ය වේ. නමුත් එයට පිළිතුරු සපයා ඇත්තේ 98.75%ක ප්‍රතිශතයකි. අපේක්ෂකයන්ගෙන් 1.25%ක් අනිවාර්ය ප්‍රශ්නය වන මෙයට පිළිතුරු සපයා නොමැත.

පළමු ප්‍රශ්නය කොටස් 10කින් යුක්ත අතර සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන ලෙස සකසා ඇත. දෙවන ප්‍රශ්නයේ සිට අටවන ප්‍රශ්නය දක්වා ප්‍රශ්න අතුරෙන් පිළිතුරු සැපයිය යුත්තේ තෝරාගත් ප්‍රශ්න 04කට පමණි.

දෙවැනි ප්‍රශ්නය සමාජ විද්‍යා න්‍යායන්හි මූලික සංකල්ප බුදු දහම හා ගලපා සකසා ඇති අතර එම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 65.63%කි. අපේක්ෂකයන් අඩුම සංඛ්‍යාවක් එනම් 26.88%ක් පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත්තේ 6 ප්‍රශ්නයයි. සමාජ පාලනය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ 6 ප්‍රශ්නය හැරුණු කොට අඩුම අපේක්ෂක සංඛ්‍යාවක් එනම් 38.13%ක් පිළිතුරු සැපයීම සඳහා සමාජ විද්‍යා පර්යේෂණ මූලිකව ඉදිරිපත් කර ඇති 8 ප්‍රශ්නය තෝරා ගෙන ඇත.

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





II පත්‍රයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය ලකුණු ප්‍රාන්තර අනුව මෙම ප්‍රස්තාරයේ දක්වා ඇත.

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා-:
2 ප්‍රශ්නය ගත් කළ ඒ සඳහා ලකුණු 0-25% ක් අතර ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-5ත් අතර ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 47.62%කි. ලකුණු 76- 100% අතර ප්‍රාන්තරයේ එනම් ලකුණු 16-20ත් අතර ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 2.86%කි.

ප්‍රස්තාරය 3.2 ( RD/16/2/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදී)

## 3.4 II වන ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 3.3: (RD/16/4/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 7 ප්‍රශ්නයේ I කොටසෙහි පහසුතා දර්ශකය 0. 93කි. එනම් 7 I කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 93%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 93%ක් ලෙස දැක්විය හැකිය. අපේක්ෂකයන් අවම ප්‍රතිශතයක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 6 II කොටසෙහි පහසුතා දර්ශකය 0.10කි. එනම් 6 II කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 10% ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 10% ක් ලෙස දැක්විය හැකිය.

## 3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**පහත පිළිතුරු අතුරින් එකක් පමණක් සඳහන්ව ඇත්නම් ලකුණු 1ක් ද, දෙකක් සඳහන්ව ඇත්නම් ලකුණු 2ක් ද (සම්පූර්ණ ලකුණු) ලබාදෙන්න. එමෙන්ම ඉහත පිළිතුරුවලට අමතරව ප්‍රශ්නයට ගැළපෙන පිළිතුරු ලියා තිබේනම් ඒ පිළිබඳව ද සැලකිලිමත් වී අවශ්‍ය ලකුණු ලබා දීම සිදු කරන ලදී.**

**01 ප්‍රශ්නය**

(i) **ඔගස්ට් කොම්ට්ට අනුව සමාජය අධ්‍යයනය කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න.**

1. සමාජ ස්ථිතිකත්වය
2. සමාජ ගතිකත්වය හෝ සමාජ ජංගමය

**(ලකුණු 02 යි)**

(ii) **සමාජ විද්‍යාවේ අරමුණු දෙකක් ලියන්න.**

අන්තර් මානුෂික සම්බන්ධතා හැදෑරීම, සමාජ සිද්ධි හෝ සමාජ කරුණු අධ්‍යයනය කිරීම, සමාජ ක්‍රියාව අධ්‍යයනය කිරීම, සමාජ පන්ති හැදෑරීම, සමාජ ආයතන හෝ සමාජ සංස්ථා අධ්‍යයනය කිරීම.

**(ලකුණු 02 යි)**

(iii) **එමිල් ඩුර්කයිම් දැක්වූ චේන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

සංකීර්ණ ශ්‍රම විභජනයක් පැවතීම, අන්තර් පුද්ගල සම්බන්ධතා ගිවිසුම් හෝ සම්මුති මත පදනම් වීම, ආර්ථික හා නෛතික සම්බන්ධතා පැවැත්වීම, සාධිත තත්ත්වයට ප්‍රධානත්වයක් ලැබීම, නෛතික සමාජ පාලනය ප්‍රධාන වීම, සංකීර්ණ සමාජයක් වීම, පෞද්ගලික අරමුණුවලට මූලිකත්වයක් හිමිවීම, ශ්‍රම විභජන ඒකක අතර කෘත්‍යාත්මක සම්බන්ධතා ගොඩනැගීම.

**(ලකුණු 02 යි)**

(iv) **බෞද්ධ ඉගැන්වීම්වලට අනුව පෙන්වා දිය හැකි දියුණුවේ ප්‍රධාන ආකාර දෙක මොනවාද?**

1. ලෞකික දියුණුව
2. ආධ්‍යාත්මික හෝ ලෝකෝත්තර දියුණුව
   (මෙලොව හා පරලොව දියුණුව)

**(ලකුණු 02 යි)**

(v) **සෑම ආගමකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

ආගමික විශ්වාස හා අදහස්, පුදපූජා හා යුතුකම්, ආගමික සංවිධාන, ආගමික හැඟීම්, ආගමික චාරිත්‍ර **(ලකුණු 02 යි)**

(vi) **රාජ්‍ය පාලනයේ මූලධර්ම ලෙස උපයෝගී කර ගත හැකි මූලික බෞද්ධ ඉගැන්වීම් දෙකක් සඳහන් කරන්න.**

දසරාජ ධර්ම, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු **(ලකුණු 02 යි)**

(vii) **පොලීසියේ මූලික කාර්යභාරයන් දෙකක් සඳහන් කරන්න.**

නීතිවිරෝධී කටයුතු වැළැක්වීම හා ඒ පිළිබඳ විමසිලිමත් වීම, නීති කඩකරන්නන් අධිකරණයට ඉදිරිපත් කිරීම, නීතිය හා සාමය ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂාව පැවැත්වීම, අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම, රාජ්‍ය ආරක්ෂා කිරීම.

**(ලකුණු 02 යි)**

(viii) **දුගීබව තුළින් නිර්මාණය විය හැකි සමාජ ගැටලු දෙකක් ලියන්න.**

අපරාධ, සිය දිවි නසා ගැනීම, මදිරාබාධය, ගණිකා වෘත්තිය

**(ලකුණු 02 යි)**

(ix) **සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු බෙදා දැක්විය හැකි මූලික කොටස් දෙක මොනවාද?**

1. ශාස්ත්‍රීය අරමුණු - පවතින දැනුම පිරික්සීම, තහවුරු කිරීම, නව දැනුම පිරික්සීම.
2. උපයෝගිතා අරමුණු - ක්‍රියාත්මක දෙයක කාර්ය සාඵල්‍යතාව, සමාජ බලපෑම, කාර්යක්ෂමතාව, උපයෝගිතාව විමසා බැලීම.

**(ලකුණු 02 යි)**


(x) **කරණීයමෙත්ත සූත්‍රයේ ඉගැන්වෙන පරිදි සමාජ ජීවියෙකු ලෙස පුද්ගලයා ගොඩනගා ගත යුතු ගුණාංග දෙකක් ලියන්න.**

සක්කෝ - හැකියාව ඇත්තෙකු විය යුතුය. උජූ ච සූජූ ච - ඍජු විය යුතුයි. මනා සේ ඍජු විය යුතුයි, සුවචෝ - කීකරු විය යුතුයි, මුදු - මෘදු විය යුතුයි, අනතිමානී - අධි මානයෙන් තොර විය යුතුයි, සන්තුස්ස කො - ලද දෙයින් (අවශ්‍ය හා අත්‍යවශ්‍ය දෙයින්) සතුටු විය යුතුයි. සුභරො - පහසුවෙන් පෝෂණය කළ හැකි අයෙකු විය යුතුයි, අප්පකිච්චො - කටයුතු අඩු අයෙකු විය යුතුයි, සල්ලහුක වුත්තී - සැහැල්ලු ගති පැවතුම් ඇති කරගත යුතුයි, සන්ත්‍රින්ද්‍රි - ඉන්ද්‍රිය සංවරය ඇති කරගත යුතුයි, නිපකො - තැනට සුදුසු නුවණින් යුතුව කටයුතු කළ යුතුයි, අප්පගබ්බො - රළු පැවතුම් නැත්තෙකු විය යුතුයි.

**(ලකුණු 02 යි)**

**(ලකුණු 02 x 10 = 20යි)**

## 01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.4(a)


II පත්‍රයේ පළමු ප්‍රශ්නය වන මෙය අනිවාර්ය ප්‍රශ්නයයි. මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුවද අංක 3.1 ප්‍රස්තාරයට අනුව මේ සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 98.75%කි. 01 ප්‍රශ්නයට අනුකොටස් 10ක් ඇතුළත් අතර ඒ සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන්,

00 -05 ප්‍රාන්තරයේ 27%ක් ද
06 -10 ප්‍රාන්තරයේ 47%ක් ද
11 -15 ප්‍රාන්තරයේ 25%ක් ද
16 -20 ප්‍රාන්තරයේ 01%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 26%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 74%කි.




ප්‍රස්තාරය 3.4(b)

කොටස් 10කින් සමන්විත මෙම ප්‍රශ්නයේ (vii) හා (i) කොටස් දෙකෙහි පහසුතාව පිළිවෙලින් 70%ක් හා 60%ක් වේ. පහසුතාව වැඩිම (vii) කොටස මූලික කාර්යභාරයන් පිළිබඳව විමසා ඇති අතර (i) කොටසින් සමාජ න්‍යායන් පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇත. මෙම ප්‍රශ්න කොටස් දෙකෙහිම වැඩි පහසුතාවට අපේක්ෂකයාට ඉතා සමීප, හුරුපුරුදු නිතර අධ්‍යයනය වන විෂය කොටස් වීම හේතු වී ඇති බව සිතිය හැකිය.

පහසුතාව අඩුම (ix) කොටසෙහි පහසුතාව 16%කි. සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ වැඩි අවධානයක් යොමු නොවීම මෙවැනි අඩු ශිෂ්‍ය සාධනයකට හේතු වී තිබිය හැකිය.

සමස්තයක් ලෙස සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හා මූලික කරුණු පිළිබඳව ස්මරණ ශක්තිය වර්ධනය කිරීම සඳහා ඒවා ස්මරණය කළ හැකි උපක්‍රම භාවිතයට ශිෂ්‍යයන් උනන්දු කරවිය යුතු අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමාජය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී හැකිතාක් එදිනෙදා ජීවිතය හා යබැඳි උදාහරණ හා ඒකාබද්ධව සිදු කිරීමට පරිවේණාචාර්යවරුන් ක්‍රියා කළ යුතුය.

සමාජ විද්‍යා විෂයය නිර්දේශය ආවරණය වන අනිවාර්ය ප්‍රශ්න සඳහා පසුගිය විභාග ප්‍රශ්න උපයෝගී කරගෙන පිළිතුරු සැපයිය යුතු ආකාරය පිළිබඳව ශිෂ්‍යයන්ට හුරුව ලබා දීම මගින් මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සංවර්ධන මට්ටමක් කරා ළඟා කර ගැනීමට හැකියාව ලැබේ.

**පොදු උපදෙස් ඃ (ප්‍රශ්න අංක 02 - 08 දක්වා)**

1. **I කොටස සඳහා දී ඇති පිළිතුරුවලින් එකක් (01) ලියා ඇත්නම් ලකුණු එකක් (01) ද, දෙකක් (02) ලියා ඇත්නම් ලකුණු (02) ද ලබා දෙන ලදී. මෙහි සඳහන් කර නැති වුවද ප්‍රශ්නය සඳහා ගැළපෙන පිළිතුරක් ලියා ඇත්නම් ඒ සඳහා ලකුණු ලබාදෙන ලදී.**

2. **II කොටස සඳහා දී ඇති පිළිතුරුවලින් එකක් ලියා ඇත්නම් ලකුණු එකක් (01)ක් ද දෙකක් ලියා ඇත්නම් ලකුණු (02) තුනක් ලියා ඇත්නම් ලකුණු (03) ද ලබාදෙන ලදී. එයට අමතරව ප්‍රශ්නයට ගැළපෙන පිළිතුරු සපයා ඇත්නම් ඒ පිළිබඳව සැලකිලිමත් වී ලකුණු ලබාදෙන ලදී.**

3. **III කොටස සඳහා සඳහන් කර ඇති කරුණු දෙකට (02) ලකුණු දෙකක්ද, ඒ පිළිබඳව කර ඇති විස්තරවලට ලකුණු තුනක් (03) ද (1.5 x 2) වන අයුරින් ලකුණු ලබා දීම සිදු කරන ලදී.**

**02 ප්‍රශ්නය**

(i) **එමිල් ඩුර්කයිම් විසින් විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කළ ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.**

ශ්‍රම විභජනය, ආගම, සිය දිවි නසා ගැනීම, සමාජ පරිණාමය, අධ්‍යාපනය, ආචාර ධර්ම

**(ලකුණු 02 යි)**

(ii) **සමාජ විද්‍යාවේ බිහිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන ඓතිහාසික සංසිද්ධි තුන මොනවාද?**

1. ආගමික ප්‍රතිසංස්කරණ
2. කාර්මික විප්ලවය
3. දේශපාලන ප්‍රතිසංස්කරණ / ප්‍රංශ විප්ලවය


**(ලකුණු 03 යි)**

(iii) **යහපත් සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමට මග පෙන්වන සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ඉගැන්වීම් දෙකක් අගය කරන්න.**

- සදිසා නමස්කාරය - දෙමාපිය දූදරු සම්බන්ධය, ගුරු සිසු සම්බන්ධය, අඹු සැමි සම්බන්ධය, මිත්‍ර මිත්‍ර සම්බන්ධය, ගිහි පැවිදි සම්බන්ධය, ස්වාමි සේවක සම්බන්ධය
- සතර කර්ම ක්ලේශ
- සතර අගති
- අපාය මුඛ / භෝග විනාශ මුඛ හය
- පාප මිත්‍ර වර්ජනය හා කළ්‍යාණ මිත්‍ර සේවනය
- ධනෝපාර්ජනය හා සංරක්ෂණය යන ඉගැන්වීම් ඇසුරින් සුදුසු කරුණු දෙකක් සඳහන් කර ඉන් යහපත් සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමට උපකාරී වන ආකාරය ඇගයීම් කර තිබේ නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන ලදී

**(ලකුණු 05 යි)**

## 02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.5(a)


2 ප්‍රශ්නය තෝරාගත යුතු ප්‍රශ්නයකි. අංක 3.1 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 65.63%කි. මෙම ප්‍රශ්නය කොටස් 03කින් යුක්තය. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 10කි.

ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 48%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 35%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 14%ක් ද
08-10 ප්‍රාන්තරයේ 03%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 17%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 83%කි.




ප්‍රස්තාරය 3.5(b)

මෙම ප්‍රශ්නයේ පළමු කොටසේ පහසුතාව 22%ක් ද, දෙවන කොටසෙහි පහසුතාව 35%ක් ද, තුන්වැනි කොටසේ පහසුතාව 60%ක් ද වේ.

දෙවන ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව සැළකීමේ දී අපේක්ෂකයන් වැඩි පිරිසක් අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වී නොමැති බව අනාවරණය වේ. මෙහි පළමු කොටසට අදාළව සමාජ විද්‍යා දැනුම් පරාසයේ ඇති වැදගත්කම පිළිබඳව සිසුන්ගේ අවබෝධය වැඩි දියුණු කළයුතු බව අවධාරණය කෙරේ. සමාජ විද්‍යාව හැඳින්වීම ඒකකය යටතේ දක්වෙන සමාජ විද්‍යාවේ ආරම්භය, විකාශය, මූලික සංකල්ප විෂය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන මෙන්ම බුදු දහමේ දක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්ප පිළිබඳව අවධානය යොමු වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුව ඇත. එමෙන්ම සමාජ විද්‍යාවේ ආරම්භය විකාශනය හා මූලික සංකල්ප පිළිබඳ සිසුන්ගේ අවබෝධය සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

**03 ප්‍රශ්නය**

(i) **කාලය නම් නිර්ණායකය අනුව සමාජ වෙනස්වීම විග්‍රහකළ හැකි ප්‍රධාන ආකාර දෙක මොනවාද?**

1. කෙටි කාලීන සමාජ වෙනස්වීම.
2. දිගු කාලීන සමාජ වෙනස්වීම.

**(ලකුණු 02 යි)**

(ii) **නවීකරණයේ ප්‍රධාන ආකාර තුනක් සඳහන් කරන්න.**

ආර්ථික නවීකරණය, දේශපාලන නවීකරණය, අධ්‍යාපන නවීකරණය, ජනමාධ්‍ය නවීකරණය, ප්‍රවාහන නවීකරණය


**(ලකුණු 03 යි)**

(iii) **බටහිරකරණයේ බලපෑමෙන් ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.**

දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික වශයෙන් ඇති වූ වෙනස්කම් දෙකක් සඳහන් කර ඒවා පැහැදිලි කර තිබේනම් සම්පූර්ණ ලබාදෙන්න. නිදසුන් - පාලන රටාව, ආගම, අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය, වෙළඳාම, ප්‍රවාහනය, ඇඳුම් පැලඳුම්, ආහාර පාන, භාෂාව, කුලය, කලා ශිල්ප, සාහිත්‍ය යන කරුණු දෙකක් ඇසුරෙන් ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් පැහැදිලි කර තිබේනම් සම්පූර්ණ ලකුණු ලබා දෙන ලදී.

**(ලකුණු 05 යි)**

## 03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.6(a)


අංක 3.1 ප්‍රස්තාරයට අනුව 3 ප්‍රශ්නයට පිළිතුරු දී ඇති සමස්ත අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 53.75%කි. I කොටසට ලකුණු 02ක් II කොටසට ලකුණු 03ක් III කොටසට ලකුණු 05ක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 47%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 43%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 09%ක් ද
08-10 ප්‍රාන්තරයේ 01%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 10%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයින් ප්‍රතිශතය 90%කි.



ප්‍රස්තාරය 3.6(b)

මෙම ප්‍රශ්නයේ පළමු කොටසේ පහසුතාව 39%ක්ද, දෙවන කොටසේ පහසුතාව 26%ක්ද, තුන්වන කොටසේ පහසුතාව 39%ක් ද වේ.

මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 35%කි. මේ අනුව සමාජ පරිණාමය පිළිබඳ න්‍යායාත්මක දැනුම මෙන්ම ව්‍යවහාරාත්මක දැනුම අපේක්ෂිත මට්ටමකට සංවර්ධනය වී නොමැති බව මින් නිරීක්ෂණය වේ. එම නිසා සමාජ වෙනස් වීම් මාතෘකා යටතේ තව දුරටත් විෂය කරුණු පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. සමාජ වෙනස්වීම් පිළිබඳව නිරන්තරයෙන් ශිෂ්‍යයන් යාවත්කාලීන කිරීම උදෙසා කාලීනව සිදුවන විශේෂිත සමාජමය වෙනස්වීම් සම්බන්ධයෙන් ගවේෂණය කිරීම සිදු කිරීමට ඔවුන්ව පෙළඹවිය යුතු ය.

සමාජ වෙනස්වීම පිළිබඳ න්‍යායාත්මක දැනුම වර්ධන කිරීමට ගුරු මාර්ගෝපදේශයේ දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කිරීමට කටයුතු කළ යුතු ය. එමෙන්ම ශ්‍රී ලංකේය සමාජයේ සිදු වූ හා සිදු වෙමින් පවතින වෙනස්කම් පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය තුළින් සිසුන්ගේ අවබෝධය හා විශ්ලේෂණ කුසලතා වර්ධනයට කටයුතු කළ යුතු ය.

04 ප්‍රශ්නය

(i) **'සංස්කෘතික ලැග්ම' යනු කුමක්ද?**

භෞතික සංස්කෘතියේ දියුණුවට සාපේක්ෂව අදහස්, චාරිත්‍ර වාරිත්‍ර ආදී අභෞතික සංස්කෘතිය වෙනස් නොවීමයි.

**(ලකුණු 02 යි)**

(ii) **සංස්කෘතියක අන්තර්ගත අංග තුනක් සඳහන් කරන්න.**

අදහස්, ප්‍රතිමාන / ධර්මතා - ජන චර්යා හා ගණාචාර, නීතිය, සාරධර්ම, දැනුම, විශ්වාස, කලාව, පුරුදු, ද්‍රව්‍යයන් / භෞතික නිර්මාණ


**(ලකුණු 03 යි)**

(iii) **මානව හිතවාදි සංස්කෘතියක් නිර්මාණය කර ගැනීමට බෞද්ධ පංචශීල ප්‍රතිපත්තියේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.**

- ජීවිතයක වටිනාකම
- දේපල ආරක්ෂාව
- පවුල් ජීවිතයේ සුරක්ෂිතතාව හා සමාජ රෝගවලින් ආරක්ෂාව
- සත්‍ය දැනගැනීමේ අයිතිය
- පියවි සිහියෙන් සමාජයට මුහුණදීම ආදී මානව හිතවාදී ලක්ෂණ ගොඩනැගීම කෙරෙහි පංචශීලයේ වටිනාකම සිල්පද දෙකක් ඇසුරින් විස්තර කර තිබේනම් සම්පූර්ණ ලකුණු ලබා දෙන ලදී.

**(ලකුණු 05 යි)**

## 04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.7(a)


අංක 3.1 ප්‍රස්තාරයට අනුව 4 ප්‍රශ්නය තෝරාගෙන ඇති ප්‍රතිශතය 55.63%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 43%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 24%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 19%ක් ද
08-10 ප්‍රාන්තරයේ 14%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 33%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 67%කි.




ප්‍රස්තාරය 3.7(b)

මෙම ප්‍රශ්නයේ පළමු කොටසේ පහසුතාව 24%ක් ද, දෙවැනි කොටසේ පහසුතාව 33%ක් ද, තුන්වැනි කොටසේ පහසුතාව 52%ක්ද වේ.

සමස්ත ප්‍රශ්නයේ පහසුතාව 36%කි. මේ අනුව සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක දැනුම මෙන්ම ව්‍යවහාර මත අවබෝධය තව දුරටත් සංවර්ධනය විය යුතු බව නිරීක්ෂණය වේ. සංස්කෘතිය පිළිබඳ නිර්වචන, සංස්කෘතියට අදාළ ගති ලක්ෂණ සමාජය කෙරෙහි සංස්කෘතියේ බලපෑම ගෝලීය ප්‍රවණතා සංස්කෘතියට බලපාන අයුරු, බුදු දහම ඇසුරින් ශ්‍රී ලාංකික සංස්කෘතියේ ඇති වූ ප්‍රවණතා මෙන්ම පෞරුෂ සංවර්ධනයේ දී සංස්කෘතියේ බලපෑම පිළිබඳව විචාරශීලී අවබෝධයක් ශිෂ්‍යයන්ට ලබා දීමට කටයුතු කළ යුතු ව ඇත.

සංස්කෘතිය පිළිබඳ මූලික සංකල්ප අවබෝධ කර ගැනීමට හැකි අයුරින් ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වේ. එමෙන්ම ගුරු මාර්ගෝපදේශයේ දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කිරීමට ක්‍රියා කළ යුතු ය.

**05 ප්‍රශ්නය**

(i) **සමාජ විවිධත්වය ඇතිවීම කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.**

ජන වාර්ගිකත්වය, ආගම්, භාෂාව, කුලය, රැකියාව, ධනය, පන්තිය, සමේ වර්ණය, සංස්කෘතිය, ජීවත්වන ප්‍රදේශය / භෞතික පරිසරය, කාලගුණික හා දේශගුණික සාධක

**(ලකුණු 02 යි)**

(ii) **භික්ෂුව යන තත්ත්වයට අදාළ ප්‍රධාන කාර්යයන් තුනක් සඳහන් කරන්න.**

ධර්ම / ත්‍රිපිටකය හැදෑරීම, ධර්මයේ හැසිරීම, විමුක්ති මාර්ගයේ ගමන්කිරීම හා මගපෙන්වීම, ධර්මය දේශනා කිරීම / ධර්මය ප්‍රචාරයෙහි නිරත වීම, ආගමික කාර්යයන් සිදුකිරීම, සමාජ කාර්යයන් සිදුකිරීම.


**(ලකුණු 02 යි)**

(iii) **පරාභව සූත්‍රයේ දැක්වෙන සුරා ධූර්ත බව පුද්ගලයාගේ මෙන් ම සමාජයේ පිරිහීමට බලපාන ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

කායික හා මානසික රෝගාබාධ ඇතිවීම, පවුල හා සමාජය ආශ්‍රිතව ගැටුම් / අපරාධ ඇතිවීම, තත්ත්වයන්ට අදාළව කළ යුතු කාර්යභාරයන් ප්‍රමාදවීම හා සිදුනොවීම, ධනය හා වත්කම් විනාශ වීම, ගෞරවය හා පිළිගැනීම නැතිවීම ආදි කරුණු දෙකක් සඳහන් කර එය පුද්ගලයාගේ මෙන් ම සමාජයේ පරිහාණියට බලපාන ආකාරය විචාරශීලීව කරුණු දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන ලදී.

**(ලකුණු 05 යි)**

## 05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.8(a)

අංක 3.1 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 56.25%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 28%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 42%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 17%ක් ද
08-10 ප්‍රාන්තරයේ 13%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 30%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයින් ප්‍රතිශතය 70% කි.




ප්‍රස්තාරය 3.8(b)

පළමු කොටසේ පහසුතාව 28%ක් ද, දෙවැනි කොටසේ පහසුතාව 73%ක් ද, තුන්වැනි කොටසේ පහසුතාව 48%ක් ද වේ. ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 50%කි. මේ අනුව පුද්ගලයා හා සමාජය පිළිබඳ න්‍යායාත්මක හා ව්‍යවහාරාත්මක අවබෝධය යම් සාධන මට්ටමකට ළඟා වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම සාධනය ඉහළ නැංවීම සඳහා සමාජ විවිධත්වය පිළිබඳව ඇති ඉතා අල්ප දැනුම වර්ධනය කිරීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධානය යොමු කළ යුතුව ඇත. භික්ෂුවකගේ කාර්යභාරය පිළිබඳව ඇති ප්‍රායෝගික නිපුණතාව සැලකිය යුතු මට්ටමක පවතී.

බුදු දහමේ අන්තර්ගත මූලික ඉගැන්වීම් මෙන්ම බෞද්ධ සූත්‍ර ධර්මයන්හි ඇති දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීම සමාජයට බලපාන ආකාරය සමාජ සිදුවීම් ඇසුරින් අධ්‍යයනයට සිසුන් යොමු කළ යුතු ය. ඒ සඳහා පෙළපොතේ ඇති කරුණු ඉගැන්වීමට අමතරව සිසුන්ට ගැළපෙන යෝග්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම සිසුන්ගේ අවබෝධය වර්ධනය කිරීමට හේතු වේ.

**06 ප්‍රශ්නය**

(i) **සමාජ පාලනය සඳහා උපයෝගී කර ගත හැකි, කතෝලික ආගමේ දස පනතේ දැක්වෙන ප්‍රධාන කරුණු දෙකක් සඳහන් කරන්න.**

ප්‍රාණඝාතය නොකරව, කාමය වරදවා නොහැසිරෙව, අදත්තාදානය නොකරව, බොරු සාක්ෂි කියන්නෙක් නොවෙව, අන් සතු අයට හා වස්තුවට ආශා නොකරව, දෙමාපියන්ට ගෞරව පූජා කරව, රූප වන්දනා නොකළ යුතුය, දෙවියන්ගේ නාමයෙන් නිකරුණේ නොදිවුරනු

**(ලකුණු 02 යි)**

(ii) **අවිධිමත් සමාජ පාලන කාරක තුනක් සඳහන් කරන්න.**

සිරිත් විරිත්, සම්ප්‍රදායන්, ධර්මතා, සාරධර්ම, චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි, විශ්වාස, අගයන්


**(ලකුණු 03 යි)**

(iii) **සමාජ පාලනය සඳහා පිරිවෙන් අධ්‍යාපනයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් අගයන්න.**

පෞරුෂ වර්ධනය, බෞද්ධ සාරධර්ම චරිතායනය, ආකල්ප සංවර්ධනය, සංයමය හා විනයගරුක බව ඇති කිරීම, නායකත්ව ගුණාංග ප්‍රගුණ කිරීම හා නායකත්වයන් ගොඩනැගීම, මෘදු කුසලතා සංවර්ධනය, සමාජ සේවාවන් සඳහා යොමු කිරීම වැනි කරුණු දෙකක් දන්වා ඒවා ඇසුරින් පිරිවෙන් අධ්‍යාපනයේ වටිනාකම සාකච්ඡා කර තිබේනම් සම්පූර්ණ ලකුණු ලබාදෙන ලදී.

**(ලකුණු 05 යි)**

## 06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.9(a)

අංක 3.1 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 26.88%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 47%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 30%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 14%ක් ද
08-10 ප්‍රාන්තරයේ 09%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 23%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයින් ප්‍රතිශතය 77%කි.




ප්‍රස්තාරය 3.9(b)

මෙම ප්‍රශ්නයේ පළමු කොටසේ පහසුතාව 20%ක් ද, දෙවන කොටසේ පහසුතාව 10%ක් ද, තුන්වන කොටසේ පහසුතාව 40%ක් ද වේ. මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 24%ක් තරම් අවම අගයකි. මෙයින් සමාජ පාලනය පිළිබඳ අවබෝධය අපේක්ෂිත මට්ටමට සංවර්ධනය වී නොමැති බව නිරීක්ෂණය වේ.

දෙවනි ප්‍රශ්න පත්‍රයේ පහසුතාව අඩුම ප්‍රශ්නයක් ලෙස මෙම 06 ප්‍රශ්නය කැපී පෙනෙයි. එම නිසා වෙනත් ආගම්, අවිධිමත් සමාජ පාලන ක්‍රම හා පිරිවෙන් අධ්‍යාපනයේ සමාජ පාලනය වන ආකාරය පිළිබඳ දැඩි අවධානයක් යොමු කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හැඩගස්වා ගැනීමට කටයුතු කළ යුතු යි. එමෙන්ම සමාජ පාලනය කෙරෙහි අවිධිමත් සමාජ පාලන උපකරණ ක්‍රියාත්මක වන ආකාරය ප්‍රායෝගික සමාජ සිදුවීම් ඇසුරින් අධ්‍යයනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීම යෝග්‍ය වේ.

සමාජ පාලනය සඳහා තුලනාත්මක ආගම්වල දැක්වෙන සාරධර්ම පද්ධති හඳුන්වා දීමටත් ඒවා ඇගයීමටත් සිසුන් යොමු කළ යුතු ය.

අධ්‍යාපන පද්ධතියක් තුළින් දැනුම, ආකල්ප හා කුසලතා සමමුහුර්ත වීමෙන් ගොඩනැගෙන නිපුණතාව අපේක්ෂා කරන බව ක්‍රියාකාරකම් ඇසුරින් සිසුන්ට අවබෝධ කිරීමට කටයුතු කළ යුතු ය.

**07 ප්‍රශ්නය**

(i) **කොරෝනා සමාජ ගැටලුවෙන් ආරක්ෂා වීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.**

සමාජ දුරස්තතාව පවත්වා ගැනීම, මුව ආවරණ පැළඳීම, එන්නත් ලබාගැනීම, ප්‍රතිශක්තිකරණ ආහාර ගැනීම, විෂබීජ නාශක භාවිතය.

**(ලකුණු 02 යි)**

(ii) **කැලිකසළ ගැටලුව මගින් සමාජයට සිදුවන හානිකර බලපෑම් තුනක් සඳහන් කරන්න.**

බෝවන රෝග ව්‍යාප්තිය, මානසික අසහනය, වගාවන් විනාශ වීම, පරිසර දූෂණය, වනජීවීන් වඳවීම

**(ලකුණු 03 යි)**


(iii) **කල්‍යාණ මිත්‍ර ඇසුර සමාජ ගැටලු නිරාවරණයට උපයෝගී වන ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.**

- උපකාරක මිත්‍රයාගේ කාර්ය - මිතුරා ආරක්ෂා කිරීම, උපකාර කිරීම
- සමාන සුඛදුක්ඛ මිත්‍රයාගේ කාර්ය - විපතේ දී හැර නොයාම
- අර්ථඛ්‍යායි මිත්‍රයාගේ කාර්ය - පාපයෙන් වැළැක්වීම, යහපතෙහි පිහිටවීම
- අනුකම්පක මිත්‍රයාගේ කාර්ය - මිතුරාගේ පිරිහීම පිළිබඳ කණගාටු වීම හා දියුණුවට මගකීම

**ඉහත කරුණු දෙකක් නිදසුන් ලෙස ගෙන පිළිතුර ලියා තිබේනම් සම්පූර්ණ ලකුණ ලබාදෙන්න.**

**(ලකුණු 05 යි)**

## 07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.10(a)

අංක 3.1 ප්‍රස්තාරයට අනුව 7වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 73.75%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 8%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 36%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 32%ක් ද
08-10 ප්‍රාන්තරයේ 24%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 56%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයින් ප්‍රතිශතය 44%කි.




ප්‍රස්තාරය 3.10(b)

මෙම ප්‍රශ්නයේ පළමු කොටසේ පහසුතාව 93%ක් ද, දෙවන කොටසේ පහසුතාව 88%ක් ද, තුන්වන කොටසේ පහසුතාව 46%ක් ද වේ. ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 76%ක් තරම් සැලකිය යුතු මට්ටමේ ඉහළ අගයකි.

මේ අනුව සමාජ ගැටලු පිළිබඳ පැහැදිලි ඉහළ න්‍යායාත්මක අවබෝධයක් අපේක්ෂකයන් සතුව පවතින බව තහවුරු වේ. නමුත් තුන්වන කොටසින් බලාපොරොත්තුවන විචාරශීලී බවත් උගත් දේ ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කරලීම පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

සමාජ ගැටලු පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් සිසුන්ට පැවතියද සමාජ ගැටලු නිරාවරණය සඳහා ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුව පවතී. ඒ සඳහා සමාජ ධර්මවල මෙන්ම ආගම ධර්මවල දක්වෙන කරුණු ව්‍යවහාර කිරීම පිළිබඳ දැනුම ලබාදීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කර ක්‍රියාත්මක කළ යුතු ය.

**08 ප්‍රශ්නය**

(i) **නිරීක්ෂණය සිදු කළ හැකි ප්‍රධාන ක්‍රම දෙකක් සඳහන් කරන්න.**

සෘජු නිරීක්ෂණ, වක්‍ර නිරීක්ෂණ, සහභාගිත්ව නිරීක්ෂණ

**(ලකුණු 02 යි)**

(ii) **දත්ත රැස්කිරීමේ උපකරණයක් ලෙස සම්මුඛ සාකච්ඡා භාවිතයේ වාසි තුනක් ලියන්න.**

රහස්‍ය තොරතුරු අනාවරණය කරගත හැකි වීම, පර්යේෂණයට අදාළ අමතර තොරතුරු රැස්කරගත හැකි වීම, පර්යේෂණය සඳහා මෙතෙක් අවධානය යොමු නොවූ තොරතුරු අනාවරණය කරගත හැකිවීම, පරීක්ෂණයට ලක්වන්නා නිරීක්ෂණය කළ හැකි වීම, නිවැරදි දත්ත ලබාගත හැකිවීම.


**(ලකුණු 03 යි)**

(iii) **නූතන සමාජ සංදර්භය තුළ සමාජ විද්‍යා පර්යේෂණවල අවශ්‍යතාව කරුණු දෙකක් ඇසුරින් පෙන්වා දෙන්න.**

මානව සමාජයේ යථා ස්වභාවය පිළිබඳ අවබෝධ කර ගැනීම, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි සංවර්ධන ප්‍රතිපත්ති හඳුනා ගැනීම, මානව සමාජයේ ප්‍රගමනයට අවශ්‍ය නව දැනුම නිර්මාණය කරගැනීම, යෝජිත සංවර්ධන ව්‍යාපෘතියක අනාගත බලපෑම පිළිබඳ කරුණු අනාවරණය කරගැනීම, ආයතනික හෝ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, සමාජ ගැටලුවලට විසඳුම් අනාවරණය කරගැනීම යන කරුණු දෙකක් සඳහන් කර සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව පෙන්වා දී ඇතිනම් සම්පූර්ණ ලකුණු ලබාදෙන ලදී.

**(ලකුණු 05 යි)**

## 08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.11(a)


අංක 3.1 ප්‍රස්තාරයට අනුව අටවැනි ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 38.13%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්,

00 -02 ප්‍රාන්තරයේ 56%ක් ද
03 -05 ප්‍රාන්තරයේ 08%ක් ද
06 -07 ප්‍රාන්තරයේ 33%ක් ද
08-10 ප්‍රාන්තරයේ 03%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 36%ක් වන අතර ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 64%කි.





ප්‍රස්තාරය 3.11(b)

මෙම ප්‍රශ්නයේ පළමු කොටසේ පහසුතාව 15%ක් ද, දෙවැනි කොටසේ පහසුතාව 33%ක් ද, තුන්වන කොටසේ පහසුතාව 21%ක් ද වේ. ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 22%ක් තරම් අවම අගයක් වීම අනුව සමාජය අධ්‍යයනය කිරීම සඳහා විචාරාත්මක ප්‍රවේශය පිළිබඳ සිසුන්ගේ අවබෝධය අපේක්ෂිත මට්ටම ළඟා වී නොමැති බව නිරීක්ෂණය වේ.

මෙම ප්‍රශ්නය මගින් සමාජ විද්‍යාවේ පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සිසුන්ගේ හැකියාව මැන බැලේ. පර්යේෂණ ක්‍රම පිළිබඳව නිසි අවබෝධයක් සිසුන් තුළ නොමැති බව පැහැදිලි වේ. ප්‍රශ්නය තෝරා ගැනීම අවම මට්ටමක පවතින අතර ශිෂ්‍ය සාධනය ද අවම මට්ටමක පවතින බැවින් සමාජ විද්‍යාව පෙළ පොතෙහි 07 වැනි මාතෘකාව හෙවත් **සමාජ අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක්** යන ඒකකය පිළිබඳ සිසුන්ගේ දැඩි අවධානයක් යොමු කළ යුතු ය. ඒ සඳහා සමාජ විද්‍යාවෙහි විද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳ පරිවේණාචාර්යවරුන් විසින් ශිෂ්‍යයන්ට දැනුම හා අවබෝධය ලබා දීමට හැකි අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත යුතුව ඇත.

සිසුන්ව සරල පර්යේෂණ සිදු කිරීමට පෙළඹිය යුතු ය. ගුරුවරයාගේ මඟ පෙන්වීම අනුව සිසුන්ව පර්යේෂණයක් සිදු කිරීමට යොමු කළ යුතු ය.

## 3.6 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු  සැපයීම  පිළිබඳ සමස්ත නිරීක්ෂණ ,නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.12 (RD/16/4/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි)

II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 08කින් සමන්විත වේ. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි ප්‍රශ්න කොටස් 10කි. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ නිශ්චිත පිළිතුරු අපේක්ෂා කෙරේ. ඉතිරි ප්‍රශ්න 07 කොටස් තුනකින් සමන්විත වේ. එහි I හා II  කොටස් වලට නිශ්චිත පිළිතුරු අපේක්ෂා කරන අතර III කොටස විශ්ලේෂණාත්මක පිළිතුරු අපේක්ෂා කෙරේ. පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ඒවායින් ප්‍රශ්න 04ක් තෝරාගෙන පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

පළමු ප්‍රශ්නයේ කොටස් විෂය නිර්දේශය දක්වෙන නිපුණතා 07 ආවරණය වන ලෙස සකසා ඇති අතර එහි පහසුතාව 43%කි. මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වුවත් ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 99%ක් පමණි.

තෝරාගෙන පිළිතුරු ලබාදිය යුතු ප්‍රශ්න 07 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය 07  වේ. එහි පහසුතාව 76%කි. අනෙකුත් ප්‍රශ්න හා සැසඳීමේ දී අපේක්ෂකයන් අතුරෙන් වැඩි පිරිසක් පිළිතුරු ලබාදීම සඳහා තෝරාගෙන ඇත්තේ ද මෙම ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය සකසා ඇත්තේ **සමාජ ප්‍රශ්න** ඒකකය යටතේය.

පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ 08 ප්‍රශ්නයයි. එහි පහසුතාව 22%කි. එම ප්‍රශ්නය සකසා ඇත්තේ සමාජ අධ්‍යනය පිළිබඳ **සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගැනීම** නම් ඒකකයෙනි. මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයන් අතුරෙන් 38%කි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් මෙම පාඩම සඳහා යෙදවිය යුතුය. **සමාජ පාලනය** පාඩමෙන් සකසා ඇති 06 ප්‍රශ්නයේ පහසුතාව 24%කි. එම ප්‍රශ්නය තෝරාගෙන ඇති ප්‍රතිශතය 27%කි. මෙම පාඩම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වඩාත් උචිතය.

තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩි 4 හා 5 වන ප්‍රශ්න තෝරා ගැනීමට අපේක්ෂකයන් බහුතරයක් යොමු නොවීම ගැටලු සහගතය. ලබා දෙන අමතර කාලය ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා පිළිතුරු සැපයිය හැකි සරල ප්‍රශ්න තෝරා ගැනීමට අපේක්ෂකයන්  දැනුවත් කළ යුතු ය.

## 4 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

- ප්‍රශ්න පත්‍රයේ හා පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් හොඳින් කියවා අනුගමනය කළ යුතු ය.
- විභාග අංකය නිවැරදිව සෑම පිටුවකම ලිවිය යුතු ය.
- ප්‍රශ්න අංකයට අදාළව පිළිතුරු ලිවිය යුතු ය.
- හැකි සෑම විටම ප්‍රශ්නයෙහි කොටස් අනුපිළිවෙළට පිළිතුරු ලිවිය යුතු ය.
- ප්‍රශ්නයට අදාළව නිශ්චිත පිළිතුරු සැපයිය යුතු ය.
- දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහටම අදාළ කොටස්වලට පිළිතුරු සැපයීම කළ යුතු ය.
- කාල කළමනාකරණය සඳහා අවධානය යොමු කළ යුතු ය. ( උපරිම වශයෙන් එක් ප්‍රශ්නයකට විනාඩි 25ක් කාලය ගත කිරීම සෑහේ)
- ප්‍රශ්නයක් ආරම්භයේ දී අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු සැපයිය යුතු ය.
- කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ද දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු පත්‍ර ඇමිණීමේ දී පිටු අංක පිළිවෙලට ඇමිණිය යුතු ය.
- II පත්‍රයේ පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. දෙවන ප්‍රශ්නයේ සිට අටවන ප්‍රශ්නය දක්වා ඇති ප්‍රශ්න හතෙන් හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු ලිවීමේ දී නිල් කාබන් පෑනක් පමණක් භාවිතය කිරීම වඩාත් සුදුසු ය.

### විශේෂ උපදෙස්

- ඉගෙනීමේ දී විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශය හා පෙළ පොත්වල ඇති උපදෙස් හා විෂය කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

- සමාජ විද්‍යා විෂය සම්බන්ධ අමතර පොත්, පුවත්පත් හා සඟරාවල ඇති ලිපි පරිශීලනය කර දැනුම සංවර්ධනය කර ගත යුතු ය.

- පසුගිය වර්ෂවල ප්‍රශ්න පත්‍රවලට හා ආදර්ශ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියා පිළිතුරු ලිවීමේ කුසලතාව සංවර්ධනය කර ගත යුතු ය.

- අමතර කියවීම් කාලය තුළ දී ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා තේරුම්ගෙන පිළිතුරු සැපයීමට පහසු ප්‍රශ්නයේ සිට පිළිතුරු ලිවීමට අවශ්‍ය ප්‍රශ්න සංඛ්‍යාව පෙළගස්වා ගෙන ඉන්පසු ලිවීම ඇරඹිය යුතු ය.

- සමාජ විද්‍යාවේ න්‍යායාත්මක දැනුම ලබාදී ප්‍රායෝගික සමාජ සිදුවිය ඇසුරින් ඒ පිළිබඳ අවබෝධය පුලුල් කර ගැනීමට අවශ්‍ය ස්වයං ඉගෙනුම් වැඩසටහන් නිර්මාණය කළ යුතු ය. ඒ තුළින් සමාජ විද්‍යාත්මක පරිලේපන කුසලතා වර්ධනය කළ යුතු ය.

## 5 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොත මෙන් ම විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ භාවිත කළ යුතු ය.

- ★ 2017 වර්ෂයේ දී හඳුන්වා දී ඇති නිපුණතා පාදක විෂය නිර්දේශයේ ඇතැම් කරුණු 2019 වර්ෂයේ දී හඳුන්වා දී ඇති ගුරු මාර්ගෝපදේශ සම්පාදනයේ දී සංස්කරණයට ලක් වී ඇත. එම සංශෝධිත නව විෂය නිර්දේශය ගුරු මාර්ගෝපදේශයන් හි නිපුණතා මට්ටම් අවසානයේ දී ඇමුණුම් ලෙස දක්වා ඇත. එහෙයින් ගුරු මාර්ගෝපදේශවල දක්වා ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වන උපදෙස් අනුගමනය කිරීම කළ යුතු ය.

- ★ උසස් අධ්‍යාපන අවස්ථාවල දී සමාජ විද්‍යාව විෂයයක් ලෙස හදාරා නොමැතිව ඉගැන්වීම් කාර්යයේ යෙදෙන ගුරුවරුන් විෂය පිළිබඳ දැනුම සංවර්ධනය කර ගැනීමටත් විෂය හදාරා ඇති ගුරුවරුන් දැනුම යාවත්කාලීන කර ගැනීමටත් කටයුතු කළ යුතු ය.

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරකම් සැකසීමේ දී පහළ බුද්ධි මට්ටමේ සිට ඉහළ බුද්ධි මට්ටම් දක්වා විහිදෙන ලෙස සැලසුම් කර ක්‍රියාවට නැගිය යුතු ය.

  එනම්, දැනුම ——— අවබෝධය ——— භාවිතය ——— විශ්ලේෂණය ——— ඇගයීම ——— නිර්මාණය දක්වා ගමන් කරන අයුරිනි

- ★ සිසුන්ගේ භාෂා කුසලතා (කියවීම්, ලිවීම්, සවන් දීම හා කතා කිරීම) විෂය ඇසුරින් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.

- ★ සමාජ විද්‍යා සම්බන්ධ වැඩ සටහන් හෝ දේශන වලට සවන්දීමටත් ඒ පිළිබඳ පොත් පත් ලිපි ලේඛන කියවීමටත් සමාජ විද්‍යා සම්බන්ධව කථා කිරීමටත් ( සාකච්ඡා , විවාද, කථා) ඒ පිළිබඳ ලිපි ලේඛන සකස් කිරීමටත් අවශ්‍ය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී,
  1. සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප
  2. සමාජ විද්‍යා න්‍යායයන් හා පර්යාවලෝක
  3. සමාජ විද්‍යාත්මක ක්‍රමවේද
  4. ව්‍යවහාරික සමාජ විද්‍යාව
  5. බුදු දහම හා සමාජ විද්‍යාව යන තේමාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

- ★ මූලාකෘති ප්‍රශ්න පත්‍රයේ ආකෘතියට අදාළ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් පුරුදු පුහුණු කිරීම අවශ්‍ය වේ.

- ★ විචාරාත්මක ප්‍රශ්න සඳහා පිළිතුරු ගවේෂණය කිරීමටත් ප්‍රශ්නයට ගැළපෙන ලෙස පිළිතුරු ලිවීමටත් පුරුදු පුහුණු කළ යුතු ය.

- ★ සමාජ විද්‍යාවේ මූලික සංකල්ප සිසුන්ගේ අද්දැකීම් ඇසුරින් ගවේෂණය කිරීමට යොමු කළ යුතු ය.

- ★ සමාජ විද්‍යාවේ විද්‍යාත්මක ක්‍රමය භාවිතයෙන් සරල පර්යේෂණයක් කිරීමට සිසුන්ට මඟපෙන්විය යුතු ය.

- ★ බුදු දහමේ දැක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්ප හා සමාජ විද්‍යාවේ ඉගැන්වීම් තුලනාත්මකව අධ්‍යයනය කිරීමට මඟපෙන්වීම කළ යුතු ය.

- ★ අවශ්‍ය අවස්ථාවල දී ගුරු උපදේශකවරයාගේ හෝ සහකාර විෂය අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් ලබාගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමට ක්‍රියා කිරීම කළ යුතු ය.

Printed by
Department of Examinations Press